# සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්

## ඇබෑර්තු

**CPC** සහ **LIOC** සමාගම් සඳහා ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන සංචිත කිරීම සහ බෙදා හැරීමේ පොදු සේවා සැපයුම් සිදුකරනු ලබන අප ආයතනය කොලොන්නාව සහ මුතුරාජවෙල පිහිටි ප්‍රධාන පර්යන්ත දෙකකින් ද දිප ව්‍යාප්තව පවතින තොග ගබඩා ජාලයකින්ද සමන්විත වෙයි.

**අප ආයතනයේ මුතුරාජවෙල පර්යන්තයෙහි පවතින පහත සඳහන් පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.**

| <u>ශ්‍රේණිය</u> | <u>තනතුර</u> |
|---|---|
| සි - 2 | වායුසමීකරණ කාර්මික ශිල්පි |

<u>අවශ්‍ය සුදුසුකම්</u>

1. ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස (සා.පෙළ) විභාගය සමත්ව සිටීම.
2. අවම වශයෙන් ජාතික ආධුනිකත්ව නිපුණතා මට්ටම 4 (NVQ Level 4) හෝ ඒ හා සමාන අන් සුදුසුකමක් සම්පූර්ණ කිරීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසර 03 ක පළපුරුද්ද.
3. වෘත්තිය පරීක්ෂණයකින් සමත් වීම.

- ➢ වයස් සීමාව : අවුරුදු 40ට නොවැඩි විය යුතුය.
- ➢ වැටුප : රු.61,310 – 5 x 735 : 10 x 925 – 74235

| <u>ශ්‍රේණිය</u> | <u>තනතුර</u> |
|---|---|
| සි - 4 | විශේෂ සහායක (උපකරණ) |

<u>අවශ්‍ය සුදුසුකම්</u>

1. අ.පො.ස (සා.පෙළ) විභාගය සමත්ව සිටීම.
2.. අවම වශයෙන් ජාතික ආධුනිකත්ව නිපුණතා මට්ටම 3 හෝ 4 (NVQ Level 3/4) හෝ ඒ හා සමාන අන් සුදුසුකමක් සම්පූර්ණ කිරීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසර 02 ක පළපුරුද්ද.

   (PABX System/Public Addressing System/CCTV System/අඛණ්ඩ බල සැපයුම් පද්ධති (UPS) හා Fire Alarm System නඩත්තු / අළුත්වැඩියා හා සේවා කටයුතු කිරීමේ හැකියාව )

3. වෘත්තිය පරීක්ෂණයකින් සමත් වීම.

- ➢ වයස් සීමාව : අවුරුදු 40ට නොවැඩි විය යුතුය.
- ➢ වැටුප : රු.53,790 – 15 x 620 – 63,090

<u>අමතර ප්‍රතිලාභ</u> :

- ප්‍රවාහන, ආහාර, නිමා සහ පැමිණීමේ දිරි දීමනා
- මාස දෙකක වාර්ෂික ප්‍රසාද දීමනා සහ එක් මසක වෛද්‍ය නිවාඩු දිරි දීමනා
- වෛද්‍යාධාර පහසුකම්
- නිවාස, ආපදා සහ ගෘහ පහසුකම් ඇතුළු ණය පහසුකම්

සමාගම විසින් සේවකයාගේ මූලික වැටුපෙන් 15% ක ප්‍රමාණයක් සේවක අර්ථසාධක අරමුදල සඳහා ප්‍රදානය කරනු ලබන අතර, සේවකයා විසින් තම මූලික වැටුපෙන් 10% ප්‍රමාණයක් සේවක අර්ථසාධක අරමුදල සඳහා ප්‍රදානය කළ යුතුය. සමාගම විසින් සේවකයාගේ මූලික වැටුපෙන් 03% ප්‍රමාණයක් සේවක භාරකාර අරමුදල සඳහා ප්‍රදානය කරනු ලබයි.

අයදුම්කරුවන් තමාගේ විස්තර සහිත ජීව දත්ත පත්‍රිකාව, ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ද සහිතව අදාළ වෘත්තීමය නිපුණතා සහතිකවල පිටපත් සමග ලියාපදිංචි තැපෑලෙන් මානව සම්පත් කළමනාකාර වෙත 2018.10.06 දිනට ප්‍රථම ලැබෙන සේ යොමු කළ යුතුය.

අයදුම් කරනු ලබන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි සඳහන් කළ යුතු අතර අදාළ තනතුර සඳහා වන මූලික සුදුසුකම් සපුරා ඇති බව තහවුරු කර ගැනීමට අවශ්‍ය තොරතුරු සඳහන් කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැකි බව කරුණාවෙන් සලකන්න.

**මානව සම්පත් කළමනාකාර**
**සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් (CPSTL)**
**කොලොන්නාව - වැල්ලම්පිටිය**
**දු.ක 2572597/2572307**